# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,107—1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්ද—14.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අඩක යොද ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 425 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 426 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 426 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 428 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 428 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 432 |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 435 |
| "පුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

1960 අංක 154

අංකය : ඩී. 42/රෙක් ව්.

### නිලධාරියෙක් පත්කිරීමක්—රාජකීය ලංකා නාවුක හමුදාව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවුක හමුදාවේ පහත සඳහන් කරන ලද පත්කිරීම අනුමත කොට තිබේ :—

**1960 මාර්තු මස 31 වැනි දින සිට, රාජ්ඤියන් වහන්සේගේ ලංකා සේවයේ නියුක්ත "ලිහිණියා" නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්—**

වැඩබලන උප ලෙප්ටිනන්ට් ඊ. පී. ඩී. කැස්පර්ස්, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 31 දින,
කොළඹ දීය.

---

1960 අංක 155

අංකය : ඩී. 42/රෙක් ව්.

### නිලධාරියෙක් පත්කිරීමක්—රාජකීය ලංකා නාවුක හමුදාව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවුක හමුදාවේ පහත සඳහන් කරන ලද පත්කිරීම අනුමත කොට තිබේ :—

**1960 අප්‍රේල් මස 1 වැනි දින සිට, රා යන් වහන්සේගේ ලංකා සේවයේ නියුක්ත "පරාක්‍රම" නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්—**

ලෙප්ටිනන්ට්-කොමාන්ඩර් ඩී. අයි. ද ලිවේරා, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 31 දින,
කොළඹ දීය.

---

1960 අංක 156

අංකය : ඩී. 42/රෙක් ව්.

### නිලධාරියෙක් පත්කිරීමක්—රාජකීය ලංකා නාවුක හමුදාව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවුක හමුදාවේ පහත සඳහන් කරන ලද පත්කිරීම අනුමත කොට තිබේ :—

**1960 අප්‍රේල් මස 1 වැනි දින සිට, රා යන් වහන්සේගේ ලංකා සේවයේ නියුක්ත "ගැමුණු" නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්—**

ලෙප්ටිනන්ට් (එන්ඩී) එම්. එම්. ඒ. වාහිඩ්, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 31 දින,
කොළඹ දීය.

1960 අංක 157

අංකය : ඞී. 42/රෙක් ට්.

### නිලධාරියෙක් පත්කිරීමක්—රාජකීය ලංකා නාවුක හමුදුව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවුක හමුදුවේ පහත සඳහන් කරන ලද පත්කිරීම අනුමත කොට තිබේ :—

**1960 අප්‍රේල් මස 1 වැනි දින සිට, රාජාදියන් වහන්සේගේ ලංකා සේවයේ නියුක්ත "අලියා" නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්—**

කොමිෂන් බලපත් ලත් බෝසන් ඒ. ඒ. වයිස්, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 31 දින,
කොළඹ දීය.

---

1960 අංක 158

අංකය : ඞී. 148/රෙක් ට්.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—නිලධාරීන් පත්කිරීම්

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් 1960 මාර්තු මස 15 වැනි දින සිට, 1949 අංක 41 දරණ ගුවන් හමුදා පනතේ 13 වැනි වගන්තිය යටතේ, ස්කොඩ්රන් ලීඩර් පී. ජී. වල්පිට වෙනුවට පහත සඳහන් කරන ලද නිලධාරීන්, බඳවා ගන්නා නිලධාරීන් වශයෙන් පත්කොට තිබේ :—

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් එස්. එන්. සමරසිංහ, ලේඛක (පී. සී.)

ප්ලයිට් ලෙප්ටිනන්ට් ඞී. වික්‍රමසිංහ, කාර්මික ඉංජිනේරු (පී.සී.)

ප්ලයිට් ලෙප්ටිනන්ට් ඇම්. කේ. ඞී. එස්. චන්ද්‍රපාල, උපකරණ (පී. සී.)

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 30 දින,
කොළඹ දීය.

---

1960 අංක 159

අංකය : ඞී. 152/රෙක් ට්.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ශාඛා වෙනස් කිරීමක්

1960 පෙබරවාරි මස 1 වැනි දින සිට ජ්‍යෙෂ්ඨතාවය ඇතිවූ සේ, ගුවන් ගමනාගමන පාලන ශාඛාවේ සිට රෙජිමේන්තු ශාඛාවට මාරු කරන ලදී.

**නම**

නියමු නිලධාරි ක්ලෝඩ් ඇන්තනි ඔස්මන්ඩ් ඩිරෙක්ස්—(01096) ගුවන් ගමනාගමන පාලන.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 31 දින,
කොළඹ දීය.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 161

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 104/60.

මහා භාණ්ඩාගාරයේ ආයතන පාලක ඇස්. ජේ. වල්පිට මහතා (සී.සී.ඇස්.) සවකීය රාජකාරිවලට අතිරේකව 1960 මාර්තු මස 8 වැනි දින සිට ඇන්. මානික්ක ඉඩෙයික්කාඩර් මහතා (සී.සී.ඇස්.) නැවත වැඩ භාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු ජනලේඛන සහ සංඛ්‍යාලේඛන අධ්‍යක්‍ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 129/59.

1960 පෙබරවාරි මස 12 වැනි දින සිට ටී. බී. ඊ. සෙනෙවිරත්න මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ හෝ නැවත නියමයක් කරන තුරු සහකාර වාරිමාර්ග අධ්‍යක්‍ෂ ඇම්. ටී. අහමඩ් මහතා නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්‍ෂ ධූරයක වැඩ බැලීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 අප්‍රේල් මස 8 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 162

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ්. 23/48.

සී. පී. නිස්සංග මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 අප්‍රේල් 5 වැනි දින සිට, කෑගල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 2,792 (ක්‍රිමිනල්), එම්. සී. කෑගල්ලේ අංක 22,412 (2 වැනි කොටස) නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑස්සී. පීපී. 10/59.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා 1960 අප්‍රේල් 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේඒ්. 8/48.

ඞී. එස්. එල්. පී. අබේසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1960 මැයි 26 වැනි දින සිට, මඩකලපුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 1,163/එල්. නඩුව අවසානවන තුරු ඇහීමට හා තීන්දුව දීමට, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඒ්. 47/48.

ඞී. එස්. එල්. පී. අබේසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 අප්‍රේල් 1 වැනි දින සිට, පානදුරේ දිස්ත්‍රික් උසාවියේ අංක 2,118 නඩුවේ තීන්දුව දීමට, පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඒ්. 18/48.

එම්. ඒ. එම්. හුසේන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 අප්‍රේල් 1 වැනි දින සිට, ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක පී. 485 නඩුවේ තීන්දුව දීමට, ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඑස්සී. පීපී. 10/59.

ඩබ්ලිව්. ඒ. වෝල්ටන් මහතා 1960 අප්‍රේල් 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, යාපනේ මහෙස්ත්‍රාත් ධූරයට හා රික්වැස්ට් කොමසාරිස් ධූරයට, යාපනේ නාගරික මහෙස්ත්‍රාත් ධූරයට, කයිට්ස් මහෙස්ත්‍රාත් ධූරයට හා රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේඒ. 21/48.

ඒ. ටී. ආර්. කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 අප්‍රේල් 8 වැනි දින සිට, ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 9,579, 597 නඩු හා නාවලපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7,937 හා 1,075 නඩු අවසානවන තුරු ඇසීමට හා තීන්දු දීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 53/48.

එස්. සෙල්ලයියා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1960 අප්‍රේල් 1 වැනි දින සිට, රත්නපුරේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 72,629, 72,121, 70,869 හා 70,513 නඩුවල තීන්දු දීමට, රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 34/48.

ඒ. අයි. අබේවික්‍රම මහතා 1960 අප්‍රේල් 6 වැනි දින, කෑගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 29,572, 29,397 හා 28,270 නඩුවල, කෑගල්ලේ මහෙස්ත්‍රාත් තුමාගේ සාක්ෂි සටහන් කර ගැනීම පිණිස, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු; ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1960 අප්‍රේල් 9 වැනි දින සිට 18 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 33ඒ/53.

වී. කේ. කන්දසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. බී. ද එස්. විජේසේකර මහතා 1960 අප්‍රේල් 5 වැනි හා 6 වැනි දිනයන්හි, කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. නටරාජා මහතා 1960 අප්‍රේල් 12 වැනි දින සිට 15 වැනි දින දක්වා, අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 56ඒ/57.

ටී. එස්. සාලි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1960 අප්‍රේල් 9 වැනි හා 10 වැනි දිනයන්හි, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 45/48.

වී. ටී. පණ්ඩිත ගුණවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1960 අප්‍රේල් 11 වැනි දින සිට 14 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. සී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. බැස්ටියන්ස් මහතා 1960 අප්‍රේල් °13 වැනි දින සිට 18 වැනි දින දක්වා, මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රාජදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එසුරපාඩිහම් මහතා 1960 අප්‍රේල් 11 වැනි හා 12 වැනි දිනයන්හි හා නැවතත් 15 වැනි දින සිට 25 වැනි දින දක්වා, පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රාජදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1960 අප්‍රේල් 14 වැනි දින හා 20 වැනි දින සිට 22 වැනි දින දක්වා පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන, තුරු, එච්. ඩී. රත්නතුංග මහතා 1960 අප්‍රේල් 7 වැනි හා 8 වැනි දිනයන්හි, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1960 අප්‍රේල් 8 වැනි දින, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : සීආර්පී/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තැවේ මහතා 1960 අප්‍රේල් 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයට හා කටුගම්පොල හත්පත්තුවේ, වන්නි හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. ඩී. පී. විජේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1960 අප්‍රේල් 14 වැනි, 16 වැනි හා 18 වැනි දිනයන්හි, ගාලු දිස්ත්‍රික්කයේ ගඟබොඩ පත්තුවේ හා හිනිදුම් පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැල්ලබොඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පර නාදන් මහතා නැති අතර, වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1960 අප්‍රේල් 19 වැනි දින, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තු ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/සූ. 2/48.

ජේ. ඩබ්ලිව්. බී. උදලාගම මහතා නැති අතර, පී. එස්. මහාලේකම මහතා 1960 අප්‍රේල් 14 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ, හරිස්පත්තුවේ, උඩ හේවාහැට හා පාත හේවාහැට ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. එස්. පිණිදිය මහතා 1960 අප්‍රේල් 11 වැනි, 12 වැනි, 14 වැනි හා 16 වැනි දිනයන්හි, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 2/57.

ඩබ්ලිව්. සී. අබේගුණවර්ධන මහතා 1960 අප්‍රේල් 8 වැනි දින, ගංගොඩවිල ගම්බද උසාවියේ අංක 6,376 නඩුව ඇසීමට, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, සල්පිටි කෝරලේ හා කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශයේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/එච්. 1/48.

ටී. එල්. ජේ. හජී මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ශ්‍රී පත්මනාදන් මහතා 1960 අප්‍රේල් 12 වැනි, 14 වැනි, හා 16 වැනි දිනයන්හි, බදුලු දිස්ත්‍රික්කයේ, වෙල්ලස්ස-බින්තැන්න හා බුත්තල ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට, හා යටිකිඳ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 1/48.

එෆ්. ඩබ්ලිව්. තල්දෙන මහතා නැති අතර, එම්. පෙරේරා මහතා 1960 අප්‍රේල් 7 වැනි දින, බදුලු දිස්ත්‍රික්කයේ, උඩුකිඳ හා වැල්ලවාය ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ට්. මයිල්වාගනම් මහතා 1960 අප්‍රේල් 11 වැනි හා 12 වැනි දිනයන්හි, වවුනියාවේ හා යාපන දිස්ත්‍රික්කවල, උතුරු වවුනියාව හා මුහුදු බඩ පත්තු ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා පූනකාරි-තුන්නුකායි, ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර, කේ. පී. ගුණරත්න මහතා 1960 අප්‍රේල් 4 වැනි දින, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර හා බස්නාහිර පස්දුන් කෝරල යන්හි, හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 අප්‍රේල් 7 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

## 1960 අංක 163

අංකය : ඩී. 33/රෙක්ට්.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—උසස් කිරීම්

ඔවුන්ගේ නම්වලට කෙළින් සඳහන් කර තිබෙන දින සිට, ප්ලයිං ඔපිසර්වරුන් වශයෙන්—

නියමු නිලධාරි ටී. ආර්. එන්. සෙල්වදුරේ (01081)—ලේඛක/ ප්‍රොවෝ—1960 මාර්තු මස 24 වැනි දින සිට.

නියමු නිලධාරි පී. එෆ්. එස්. ජයසූරිය (01082)—ලේඛක—1960 අප්‍රේල් මස 1 වැනි දින සිට.

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 මාර්තු මස 30 දින,
කොළඹදීය.

## 1960 අංක 164

අංකය : ජේ. 14/59.

1944 අංක 13 දරණ ආඥපනතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9,828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරණ ප්‍රකාශනයේ සංශෝධිත 1939 අංක 48 දරණ ළමයින් සහ බාලවයස්කාරයින් පිළිබඳ ආඥ පනතේ 3 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1960 අප්‍රේල් මස 1 වෙනි දින සිට මඩකලපුවේ මහෙස්ත්‍රාත් ධුරය දරණ කාලය තුළ, මඩකලපුවේ අධිකරණ කොට්ඨාශයට බී. ජී. ඇස්. ඩේවිඩ් මහතා ද,

1960 අප්‍රේල් මස 1 වෙනි දින සිට යාපනයේ මහෙස්ත්‍රාත් ධුරය දරණ කාලය තුළ, යාපනයේ අධිකරණ කොට්ඨාශයට ඩබ්ලිව්. ඒ. වෝල්ටන් මහතා ද,

එම මහතුන්ගේ අනිකුත් රාජකාරිවලට අතිරේක වශයෙන් ළමයින් පිළිබඳ මහෙස්ත්‍රාත්වරුන් ලෙස පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
ස්ථිර ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

1960 අප්‍රේල් මස 4 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

## 1960 අංක 165

වරදන චන්ද්‍රසිරි ලක්ෂ්මන් ද සිල්වා මහතා බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 25 වැනි දින,
කොළඹදීය.

## 1960 අංක 166

වන්නිආච්චි කංකානන්ගේ චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා මාතර අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දීය.

# ආණ්ඩුවේ නිවේදන

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලෙඛනයේ සඳහන් නියෝග ම විසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 7 වැනි අතුරු වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ හා වෙළඳ ඇමති.

1960 අප්‍රියෙල් 6 දින,
කොළඹ දි ය.

### උපලෙඛනය

| නියෝගයේ දිනය | | නියෝගය දුන් බලධාරියා | | නියෝගය බලපවත්වන ද්‍රව්‍ය | | නියෝගය පළකළ ගැසට් පත්‍රය |
|---|---|---|---|---|---|---|
| 60.2.19 | ... | මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... | සහල් සහ වී | ... | 1960.2.24 දින අංක 12,067 |
| 60.2.19 | ... | මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... | සීනි | ... | 1960.2.24 දින අංක 12,067 |
| 60.2.19 | ... | මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... | කිරිගු පිටි | ... | 1960.2.24 දින අංක 12,067 |
| 60.3.14 | ... | වව්නියා දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක | ... | සීනි | ... | 1960.3.16 දින අංක 12,085 |

## 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග ම විසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 7 වැනි අතුරු වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ හා වෙළඳ ඇමති.

1960 අප්‍රේල් මස 6 දින,
කොළඹදී ය.

### උපලෙඛනය

| නියෝගයේ දිනය | | නියෝගය දුන් බලධාරියා | | නියෝගය බලපවත්වන ද්‍රව්‍ය | | නියෝගය පළකළ ගැසට් පත්‍රය | | |
|---|---|---|---|---|---|---|---|---|
| 59.12.22 | ... | පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... ... | සහල්, වී සහ සීනි | ... | 60.2.2. | අංක | 12,052 |
| 60.1.20 | ... | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක | ... | සහල්, වී, කිරිගු පිටි, සුදු සීනි සහ දුඹුරු සීනි | | 60.1.29 | අංක | 12,048 |
| 60.2.9 | ... | බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... ... | සහල් සහ වී | ... | 60.2.15 | අංක | 12,062 |
| 60.2.9 | ... | බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... ... | සීනි | ... | 60.2.15 | අංක | 12,062 |
| 60.2.9 | ... | බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... ... | කිරිගු පිටි | ... | 60.2.15 | අංක | 12,062 |

අංකය : 2/3/1 (ඒ සී).

එල්. ඩී. බී. 98/38.

## ලංකා සේවිංස් බැංකු ආඥාපනත

වර්‍ෂ 1944රේ අංක 3 දරණ ආඥාපනතින් සහ වර්‍ෂ 1955යේ අංක 6 දරණ ආඥාපනතින් සංශොධිත වූ (278 වැනි පරිච්ඡේදය වන) ලංකා සේවිංස් බැංකු ආඥාපනතේ 11 සහ 17 වැනි වගන්ති යටතේ ලංකා සේවිංස් බැංකු අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්පාදිත වූ වර්‍ෂ 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ ප්‍රකාශනයෙන් මඳක් වෙනස් කරන ලද එකී ආඥාපනතේ 11 වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල අනුව මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රෙගුලාසිය.

ආර්. කුමාරස්වාමි,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

වර්‍ෂ 1960වේ අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹදීය.

### රෙගුලාසිය

වර්‍ෂ 1944රේ අප්‍රේල් මස 5 වැනි දින අංක 9,255 දරණ ගැසට් පත්‍රයෙහි පළ වූ වර්‍ෂ 1954රේ ජූලි මස 30 වැනි දින අංක 10,697 දරණ රෙගුලාසියෙන් සංශොධිත රෙගුලාසි පහත සඳහන් පරිදි තව දුරටත් සංශොධනය කරනු ලැබේ :—

(1) 2 වැනි රෙගුලාසියේ—

(අ) (ඒ) ඡෙදයෙහි "රුපියල් හය දහස" යන්න වෙනුවට "රුපියල් තිස් දහස" යන්න ද ;

(ආ) (බී) ඡෙදයෙහි "රුපියල් අට දහස" යන්න වෙනුවට "රුපියල් පහළොස් දහස" යන්න ද යොදන්න.

(2) 3 වැනි රෙගුලාසියේ—

(අ) (ඒ) ඡෙදයෙහි "රුපියල් විසි දහස" යන්න වෙනුවට "රුපියල් තිස් දහස" යන්න ද ;

(ආ) (බී) ඡෙදයෙහි "රුපියල් දොළොස් දහස" වෙනුවට "රුපියල් පහළොස් දහස" යන්න ද යොදන්න.

---

## 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමට ආධාර දීමේ පනත

1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමට ආධාර දීමේ පනතේ 10 වැනි ඡේදය යටතේ ගරු කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා විසින් රබර් නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු වන සී. ආර්. වොරන් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ ඒ මහතා වෙනුවට එකී මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් 1960.4.15 වැනි දින සිට හය මාසයක කාලයකට ජී. එච්. කාටර් මහතා පත්කර ඇති බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

සී. බී. පී. පෙරේරා,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ
නිත්‍ය ලේකම්.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ, මහා ලේකම් ගොඩනැගිල්ලේදීය.

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### අංක 45 දරණ තෙල්දෙනිය මැතිවරණ කොට්ඨාශයට නියෝජිතයෙක් පත්කර ගැනීම

1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය යටතේ ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශයේ අපේක්ෂකයෙක් වන මුතු බණ්ඩා වීරසේකර මැදිවක මහතා විසින් මැතිවරණය සම්බන්ධයෙන් වැය කරන ලද වියදම් ලැයිස්තුව හා ඒ සම්බන්ධව ඔහුගේ ප්‍රකාශනය 1960 අප්‍රේල් මස 4වෙනි දින මාවෙත ලැබුන බවත්, එම වියදම් ලැයිස්තුව හා ප්‍රකාශනය කාර්යාල වේලාවන්හිදී මහනුවර කච්චේරියේ මැතිවරණ කාර්යාලයේදී, රුපියලක මුදලක් ගෙවීමෙන් මෙම නිවේදනය ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට මාස හයක් ඇතුළතදී පරීක්‍ෂා කිරීමට හැකි වන බවත් මෙයින් දන්වමි.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
තීරක නිලධාරි තැන,
අංක 45 දරණ තෙල්දෙනිය මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කාර්යාලය,
කච්චේරිය, මහනුවර,
1960 අප්‍රේල් මස 7 දින.

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### අංක 50 දරණ ගම්පොල මැතිවරණ කොට්ඨාශයට නියෝජිතයෙක් පත්කර ගැනීම

1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71 (1) වැනි වගන්තිය යටතේ ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශයේ අපේක්ෂකයෙක් වන තම්බයියා වෛරමුත්තු මොහොමඩ් නූන් මහතා විසින් මැතිවරණය සම්බන්ධයෙන් වැය කරණ ලද වියදම් ලැයිස්තුව හා ඒ සම්බන්ධව ඔහුගේ ප්‍රකාශනය අප්‍රේල් මස 7 වෙනි දින මාවෙත ලැබුණ බවත්, එම වියදම් ලැයිස්තුව හා ප්‍රකාශනය කාර්යාල වේලාවන්හිදී මහනුවර කච්චේරියේ මැතිවරණ කාර්යාලයේදී රුපියලක මුදලක් ගෙවීමෙන් මෙම නිවේදනය ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට මාස හයක් ඇතුළතදී පරීක්ෂා කිරීමට හැකිවන බවත් මෙයින් දන්වමි.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
තීරක නිලධාරි තැන,
අංක 50 දරණ ගම්පොල මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කාර්යාලය,
කච්චේරිය, මහනුවර,
1960 අප්‍රේල් මස 7 දින.

---

# 4ඒ පෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් තැන්පත් ඇල්ෆ්‍රඩ් එඩ්වින් ගෝගර්ලි මොරගොඩ වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහ වැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උප ලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම්, කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මාසයක් තුලදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි. විරුද්ධවන සෑම අයකුගේ සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

ඇ. ඒ. ගෝගර්ලි මොරගොඩ,
ඉන්දියානු සහ පාකිස්තානී වාසීන් ලියා පදිංචි කිරීමේ
කොමසාරිස් තැන.

කොළඹ, 1960 අප්‍රේල් 8ද.

### උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| සී. 8492—3.8.51 | ... | මොහමඩ් ආදම් කලන්දර්ෂා, 212, ගාලු පාර, කොළඹ-4. |
| සී. 9760—6.8.51 | ... | අන්තෝනි කෘස් ප්‍රනාන්දුගේ වැන්දඹුවවූ තස්නේවිස් ප්‍රනාන්දු, 61, නිල් පටුමාවත, කොටහේන, කොළඹ-13. |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| සී 8634/ඒඒ/සී—4.8.51 | ... | සෙයෙඩ් ඕමර්ගේ පුත්‍ර මොහමඩ් සුලෙයිමන්, 163, දෙවන හරස් වීථිය, කොළඹ 11. |
| සීසී 8096/අයි—2.8.51 | ... | මායලගු මුත්තයියා, කෙල්වින්වත්ත, දෙලොස්බාගේ |
| ආර් 1850—25.3.51 | ... | වෙම්බඩි ඕමන්දු, මූන්ප්ලේන්ස් කොටස, මහගස්තොට වතුයාය, නුවරඑළිය |
| ඇන් 9027/ආර්—24.6.51 | ... | වේලන් මුත්තයියා, අංක 12, මහගස්තොට, බදුල්ල පාර, නුවරඑළිය |
| ඇන් 9380/ආර්—24.6.51 | ... | වෙම්බඩි මාරියප්පන්, නගරසභා ලැයිම, හාවඑළිය, නුවරඑළිය |
| ඇන් 9403/ආර්—8.7.51 | ... | සිතිරන් සන්ගපිල්ලෙයි, නගරසභා ලැයිම, හාවඑළිය, නුවරඑළිය |
| ඞීඞී 5530—31.7.51 | ... | පොන්නන් සුබ්‍රමනියම්, ගෝනගම වත්ත, කිතුල්ගල |

---

# 4බී ෆෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ කොමසාරිස් තැන්පත් ඇල්fප්‍රඩ් එඩ්වින් ගෝගර්ලි මොරගොඩ වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ, පහත සඳහන් උප ලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උපවගන්ති යටතේ අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබිද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

ඇ. එ. ගෝගර්ලි මොරගොඩ,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ කොමසාරිස් තැන.

1960 අප්‍රියෙල් 8 දා,
කොළඹ.

## උපලෙඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| සී 6326—1.8.51 | ... | සින්නක්කන් ජෝන් රාජනායගම්, අංක 11/7, බිස්පැන්සරි පටුමග, කොළඹ 2 | පාකියනායි අම්මාල් (භාර්යාව), සෑම් නොහොත් සැමුවෙල් ජෙයරාජ් (පුත්‍ර), ජෙබම් ධර්මරාජ් (පුත්‍ර) |
| සී 6850—3.8.51 | ... | පෙරුමාල් මුනියන්ඩි නොහොත් ජෝශප් මරියනායගම්, 928/19, 3 වැනි කොටස, මරදාන, කොළඹ 10 | මරිඅම්මාල් (භාර්යාව), වීරම්මාල් තෙරේසම්මාල් (දුව), සන්දනම් අමලාපවම් (දුව), සන්දනම් ප්‍රැන්සිස් (පුත්‍ර), ජෙබමාලෙයි (පුත්‍ර), එම්මනුවෙල් (පුත්‍ර), ලූර්දු මේරි (දුව), දේවදාසම් (පුත්‍ර), ඥානප්‍රගාසම් (පුත්‍ර) |
| සී 6899—2.8.51 | ... | ඉසුෆ්පාලි හසෙන්අලි, 11, නිමල් පාර, කොළඹ 4 | දයම්බායි (භාර්යාව), ෂිරින්බායි (දුව), සුබිදබායි (දුව), රතුබායි නොහොත් රතන්බායි (දුව); රෂිද බායි (දුව), ටාරාබායි (දුව), දුරයියා (දුව), සයිfපුඩීන් (පුත්‍ර) |
| සී 7285—4.8.51 | ... | මාදන් සන්දනම්, 143/18, ජින්තුපිටිය වීථිය, කොළඹ | වල්ලි (භාර්යාව) |
| සී 9726—4.8.51 | ... | මොහමඩ් සිකන්දර්ගේ පුත්‍ර මොහමඩ් ෂෙරිfප්, 130/33, සන්ත බස්තියන් වීථිය, කොළඹ | පිච්චම්මාල් (භාර්යාව), ෂම්සුඩීන් (පුත්‍ර), අබ්දුල් කානි නොහොත් අහමඩ් ගානි (පුත්‍ර), සිකන්දර් ගානි (පුත්‍ර), සම්සුනිසා (දුව), පාතුම්මාල් බීබී (දුව), සිති පරීඩා (දුව) |
| එච් 9040/සී—30.7.51 | ... | පෙරියනම්බි වෙම්බයියා, අංක 3, පොලිස් පාක් මාවත, හැව්ලොක් ටවුම, කොළඹ 5 | මාරී පාකියම් (භාර්යාව), නවජීවනම් නොහොත් නවමනි (දුව), පද්මිනි (දුව), ආනන්ද රාජා (පුත්‍ර) |
| කිව් 8349/සී—4.8.51 | ... | මුත්තයියා නඩේසන්, අංක 7, ස්ප්‍රිතාල වීථිය, කොළඹ 1 | සෙල්ලම්මා (භාර්යාව) |
| ඞී 1733—4.7.51 | ... | ඩේවිඩ් සින්නයියා, හන්වැල්ල වත්ත, හන්වැල්ල | අන්නලෙච්චිමී (භාර්යාව), පත්මාවති (දුව), ජෙගනාදන් (පුත්‍ර), ඩයමන්ඩ් (පුත්‍ර), චන්ද්‍රදාස් (පුත්‍ර), චන්ද්‍රාවති (දුව) |
| ඇෆ්ජ් 174—22.7.50 | ... | ආන්ඩි කල්ලාන්ඩි, කිරිමැටියා වත්ත, ගලහ | සෙල්ලම්මා (භාර්යාව) සන්මුගම් (පුත්‍ර) |
| ඇෆ්ජ් 3457—10.6.51 | ... | මුක්කන් කදිර්වේල්, ඌරගල කොටස, උඩවෙල වත්ත, මහනුවර | සුබ්‍රමනියම් (පුත්‍ර), මාරියායි (දුව), මුක්කන් නොහොත් නඩේසන් (පුත්‍ර), අමර්දම් නොහොත් රුක්මනි (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියකු ලෙස ලියා පදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම් කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියකු ලෙස ලියා පදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමඟ ලියා පදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම් කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| ඇ්ජ් 4309—11.7.51 ... | මාදසාමි පූච්චි නොහොත් සෙල්ලයියා, ඇල්ලදෙනිය, උඩ දෙල්තොට, ගලහ | මාරියායි (භාර්යාව), ක්‍රිෂ්නවනි නොහොත් ක්‍රිෂ්න දේවි අම්මාල් (දුව), තනලෙච්චිමි (දුව), කනගම්මාල් (දුව) |
| ඇ්ජ් 4412—16.7.51 ... | ෂන්මුගම් වේලයුදම්, කොල්ග්‍රේන් කොටස, ලේවැලන් වතුයාය, පුපුරුස්ස | මාරියායි. (භාර්යාව), මෙයියාතාල් (දුව), ආනන්දම් (පුතා), දේවලෙච්චිමි (දුව), පවලක්කොඩි (දුව), මෝහනවල්ලි (දුව) |
| ඇ්ජ් 4519—19.7.51 ... | ෂන්මුගම් පොන්නුසාමි, ප්‍රයිම් රෝස් හිල් වත්ත, මහනුවර | සින්නම්මා (භාර්යාව), මෝහනසුන්දරම් (පුතා), රාජමෝගන් (පුතා), ප්‍රේමා (දුව), මල්ලිකා (දුව) |
| ඇ්ජ් 4934—11.7.51 ... | අන්නමලෙයි තනුස්කොඩි, කිරිවාන පහළ කොටස, ගුරුකැලේ වත්ත, ගලහ | මාරියායි (භාර්යාව), ආරුමුගම් (පුතා), කන්නිඅම්මා (දුව), සින්නම්මා නොහොත් සාමුන්ඩි (දුව), කනපති (පුතා), වේළු නොහොත් මුත්තුලිංගම් (පුතා), වල්ලිඅම්මා (දුව), සුප්‍රමනියම් (පුතා) |
| ඇ්ජ් 5388—29.5.51 ... | රෙන්ගසාමි කරුප්පයියා, බටහිර වැදහැත්ත වත්ත, හෙන්ගල වතුයාය, පන්විලතැන්න | අන්ජලෙයි (භාර්යාව), පෙරමායි (දුව), ධම්ලිංගම් (පුතා), ආරුමුගම් (පුතා), ලෙච්චිමි (දුව), මහලිංගම් (පුතා), රෙන්ගසාමි (පුතා), කරුප්පයියා (පුතා), සීදෙයි අම්මා (දුව), ආනන්ද රාජ් (පුතා), කතේසන් (පුතා) |
| අයි 287—23.1.51 ... | කෝසිල්පිල්ලෙයි නල්ලතම්බි, අංක 44/7, ගම්පොල පාර, නාවලපිටිය | මරියන්නාල් (භාර්යාව), ලැයිස අම්මා නොහොත් ලිලී ලිසී (දුව), වේදමනි (පුතා) |
| අයි 749—25.3.51 ... | නාගු මුත්තයියාගේ දුව මහමායි, කුල්බෝන් වත්ත, නාවලපිටිය | පෙරියමරති (සොහොයුරි), ආරුමුගම් (සොහොයුරා) |
| අයි 2288—24.5.51 ... | සදයන් කරුප්පයියා, වේවැල්තලාව වත්ත, ගිනිගත්හේන | මාරියායි (භාර්යාව), සෙවනු නොහොත් නඩයසන් (පුතා), ගෝවින්දම්මා (දුව), රාමන් නොහොත් රාමයියා (පුතා) |
| අයි 5887—30.7.51 ... | මුත්තුසාමි රාමසාමි, ලක්ෂපාන විදුලිබල ස්ථානය, ලක්ෂපාන | මුනිඅම්මා (භාර්යාව), පෙරියතම්බි (පුතා), රාසයියා (පුතා) |
| අයි 6120—1.7.51 ... | කන්දසාමි සදෙයන්, ඉන්වයිරා වත්ත, රොසැල්ල | අන්ගම්මාල් (භාර්යාව), අන්ගායි (දුව), සුප්‍රමනියම් (පුතා), කන්දසාමි (පුතා), සන්මුගනාදන් (පුතා) |
| සීසී 4158/අයි—28.7.51 ... | පිච්චමුත්තු සින්නප්පන් නොහොත් මාරිමුත්තු, සීෆේජ්ත් කොටස, නාගස්තැන්න වතුයාය, දොලොස්බාගේ | අර්පුදමේරි නොහොත් පූරනම් (භාර්යාව) |
| සීසී 5084/අයි—30.7.51 ... | ෆ. . ඥදයි මාරිමුත්තු, නාගස්තැන්න වතුයාය, දොලොස්බාගේ | ලෙච්චිමි (භාර්යාව), තන්ගවේළු (පුතා), සෙල්ලම්මාල් (දුව), කාමාච්චි (දුව), මුත්තම්මා (දුව) |
| සීසී 5110/අයි—30.7.51 ... | වීරමුත්තු පිච්චෙයි, නාගස්තැන්න වතුයාය, දොලොස්බාගේ | කිලි අම්මා (භාර්යාව) |
| ඇල් 1328—13.11.50 ... | සින්නප්පන් සින්නයියා, සෝගම වත්ත, පුස්සැල්ලාව | අන්නම්මාල් (භාර්යාව) |
| ඇල් 3709—19.2.51 ... | ආදියන් රෙන්ගනාදන්, මුල්ගම වත්ත, පන්විලතැන්න | පෙරිච්චී (භාර්යාව), සවුන්දරම් (දුව), සතිවේල් (පුතා), පද්මිනාදන් නොහොත් නාදන් (පුතා), ලෙච්චිමි නොහොත් පුස්පම් (දුව) |
| ඇල් 10200—25.5.51 ... | කදිර්වේල් තන්ගවේල්, කනපතිවත්ත වත්ත, උලපනේ | මාරියායි (භාර්යාව), අමරාවතී (දුව), විසාලච්චි (දුව), සිදිරන්ගී (දුව), සුන්දමූර්ති (පුතා) |
| ඇල් 10484—17.7.51 ... | තේවරායා පිල්ලෙයි සිවලිංගම් පිල්ලෙයි, ගුරුකැලේ වතුයාය, ගලහ | කමලම් (භාර්යාව), පෙරියසාමි (පුතා), කාමාච්චි අම්මාල් (දුව), තේවරාජන් (පුතා), මුත්තුසාමි (පුතා) |
| ජී 1438/ඇල් 24.7.51 ... | වින්සන්ට් බර්නබාස්ගේ වැන්දඹුවවූ දේවසගායම් සෙල්වම්මා, වී. ඒ. බර්නබාස් මහතා බාරේ, 2, රෙඩ් ෂිල්ඩ් කැන්ටිම, යුනියන් පෙදෙස, කොළඹ 2 | ඊසාක් (පුතා) |
| අයි 2675/ඇල් 27.5.51 ... | ඇම්. සුබරායන්ගේ පුතා රාමසාමි, විල්ටන් වත්ත, නාවලපිටිය | පුන්ගාවනම් (භාර්යාව), තවමනි (දුව), රාමනාදන් නොහොත් මුනියන් (පුතා), මයිල්වාගනම් නොහොත් මයිල් (පුතා), පලනියන්ඩි (පුතා), සීරන්ගායි නොහොත් සීරන්ගම්මාල් (දුව), මාරිමුත්තු (පුතා) |
| සීසී 4220/අයි/ඇල් 28.7.51 | සෙල්ලම් කන්දයියා, ඇල්පිටිය වත්ත, ගම්පොළ ... | සිවටු (භාර්යාව), සරෝජා (දුව) |
| ආර් 347—28.10.50 ... | අන්තෝනි මුත්තු සවරිමුත්තු, රදැල්ල වත්ත, නානුඔය | සූසෙයිමේරි (භාර්යාව) |
| ආර් 1306—20.1.51 ... | පලනියන්ඩි කරුප්පයියා, කාලබෙක් වත්ත, නානුඔය | සෙල්ලම්මා නොහොත් මාරියායි (දුව) |
| ආර් 1770—14.4.51 ... | කරිවන්දන් මරුදෙයි, කැල්සේ වත්ත, නානුඔය ... | කදිරායි (භාර්යාව), පච්චන් (පුතා), පච්චායි (දුව), අවලි (දුව) |
| ආර් 1821—14.4.51 ... | ඔලවන් සුප්‍රමනියම්ගේ වැන්දඹුව වූ ලෙච්චුමායි. කැල්සේ වත්ත, නානුඔය | මුරුගයියා (පුතා), පලනියන්ඩි නොහොත් මනිවෙල් (පුතා), නෙයිවානෙයි (දුව), කුප්පුසාමි (පුතා) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| ආර් 1822—14.4.51 ... | මදලමුත්තු සවරිමුත්තු, කැල්සෝ වත්ත, නානුඔය ... | අන්තෝනිඅම්මාල් (භාය්‍යාව), අන්තෝනිසාමි (පුතා), ආරෝකියම්මාල් (දුව) |
| ආර් 1845—25.3.51 ... | සුප්පයියා සින්නයියා, මූන් ප්ලේන්ස් කොටස, මහගස්තොට වතුයාය, නුවරඑළිය | සෙල්ලාච්චි (භාර්යාව), අලමේල් නොහොත් කමලා (දුව), ක්‍රිෂ්නන් (පුතා), කාලිඅම්මා නොහොත් ක්‍රිෂ්නම්මා (දුව), සුප්පයියා (පුතා), නවසිවායම් නොහොත් සින්නතම්බි (පුතා) |
| ආර් 2337—22.4.51 ... | මුත්තන් පෙරියන්නන්, පෙඩ්රෝ වතුයාය, නුවර එළිය | මාරිමුත්තාල් (භාර්යාව), කනපති (පුතා), අන්ග මුත්තු (පුතා) |
| ආර් 4223—17.6.51 ... | පලනිමුත්තු කුප්පන්, පහළ කොටස, ඔලිපන්ට් වත්ත, නුවරඑළිය | පලනිඅම්මාල් (භාර්යාව), වේළු (පුතා), කාලියප්පන් (පුතා) |
| ආර් 4256—17.6.51 ... | රාමසාමි ක්‍රිෂ්නන් නොහොත් පෙරිය පෙරුමාල්, ඔලිපන්ට් වත්ත, නුවරඑළිය | වල්ලිඅම්මෙයි (භාය්‍යාව), මුත්තුසාමි (පුතා), ජෙය රාමන් (පුතා), සතාසිවන් (පුතා) |
| ආර් 4309—19.7.51 ... | වෙන්ගඩාසලම් ආරුමුගම්, අලගොල්ලගල, බෝරගාස් | සින්නම්මා (භාර්යාව), සාමිනාදන් නොහොත් රාම ලිංගම් (පුතා), තයිලම්මා (දුව), මුත්තුලිංගම් (පුතා), රාමනාදන් (පුතා), මුත්තයියා (පුතා), අම්මනී (දුව), රාමන් (පුතා), රුක්මනි දේවි (දුව), සෙන්තිවේල් (පුතා) |
| ආර් 4475—18.6.51 ... | මරුදෙයි තෝලන්, කැල්සෝ වත්ත, නානුඔය ... | සක්කම්මා (භාර්යාව), සින්ගමලෙයි (පුතා) |
| ආර් 5242—14.7.51 ... | පලනියන්ඩි අප්පාවු, එඩින්බර්ග් වත්ත, නානුඔය | පලනියායි (භාර්යාව), පලනියන්ඩි (පුතා), කන්නි අම්මා (දුව), සුරුම්බායි (දුව), රාසම්මා (දුව), මාරි මුත්තු (පුතා), රාමර් නොහොත් රාමු (පුතා), ලෙච්චිමි (දුව), මුත්තුලිංගම් (පුතා) |
| ආර් 5656—22.7.51 ... | මරුදමුත්තු මරුදන්, උඩ රදැල්ල වත්ත, නානුඔය ... | අන්ගම්මාල් (භාර්යාව) |
| ඇන් 9314/ආර්—8.7.51 ... | මාදන් කන්දසාමි, නගර සභා ලැයිම, හාවඑළිය, නුවරඑළිය | කාලිඅම්මා නොහොත් අන්නයි (භාය්‍යාව), මුක්කායි (දුව) |
| ඇන් 9342/ආර්—8.7.51 ... | අම්මාසි රාමසාමි නොහොත් රෙන්ගසාමි, නගර සභා ලැයිම, හාවඑළිය, නුවරඑළිය | අම්මාසි (පුතා), සෙල්ලම්මා (දුව) |
| ඇන් 9386/ආර්—8.7.51 ... | මෙරියන් සින්නප්පන්, අංක 3, ජේම්ස් වීදිය, පරණ බසාර්, නුවරඑළිය | ජේසුඅම්මා (භාර්යාව) |
| ඇන් 9390/ආර්—8.7.51 ... | මාරි මරුදෙයි, නගර සභා ලැයිම, හාවඑළිය, නුවර එළිය | සෙල්ලම්මා (භාර්යාව) |
| ඇන් 9396/ආර්—8.7.51 ... | පෙරියන්නන් වීරමලෙයි, නගර සභා ලැයිම, හාව එළිය, නුවරඑළිය | පලනිඅම්මා (භාර්යාව), සින්නසාමි (පුතා), පෙරියන් නන් (පුතා), සරස්වතී (දුව), පලනිවේල් (පුතා), තෙයිවානී (දුව), තන්ගවේළු (පුතා), නල්ලයියා (පුතා) |
| ඇන් 9405/ආර්—8.7.51 ... | පෙරියන්නන් මරුදෙයි, නගර සභා ලැයිම, හාව එළිය, නුවරඑළිය | වල්ලිඅම්මා (භාර්යාව), පෙරුමාල් (පුතා), රාමයියා නොහොත් රාමසාමි (පුතා), කාලිඅම්මා (දුව) |
| ඇන් 9406/ආර්—8.7.51 ... | කරුප්පන්නන් ආරුමුගම්, නගර සභා ලැයිම, හාව එළිය, නුවරඑළිය | පෙරිඅක්කා (භාර්යාව), කරුප්පන් (පුතා), වල්ලි අම්මෙයි (දුව), පලනිවේළු (පුතා), සෙල්ලම්මා (දුව) |
| ඇන් 9414/ආර්—8.7.51 ... | මුරුගන් මූක්කන්, නගර සභා ලැයිම, හාවඑළිය, නුවරඑළිය | කුප්පායි (භාර්යාව), පෙරුමාල් (පුතා), සීතාදේවි (දුව) |
| ඒඒ 1227—19.6.51 ... | පෙරියන්නන් කරුප්පයියා, අංක 5, කිරිවත්දල, ගල්ලැල්ල, රත්නපුර | අම්ර්දම් නොහොත් තන්ගම්මාල් (භාර්යාව), කාසි නාදන් (පුතා), බාලසුන්දරම් (පුතා) |
| සීසී 5641—3.8.51 ... | ආරුමුගම් වේළු, එඬේරපොල වතුයාය, බුලත්කොහු පිටිය | මුත්තම්මා (භාර්යාව), ජෙබමාලෙයි (දුව) |
| ඩීඩී 1351/සීසී—24.12.50 ... | සුන්දරම් අලගන්, කැලණි වත්ත, යටියන්තොට ... | සන්දනම් (භාර්යාව), මුනිඅම්මා (දුව) |
| ඩීඩී 3545—14.7.51 ... | අරුනාසලම් පෙරුමාල්, ඉහළ කොටස, දෙගලැස්ස වතුයාය, යටියන්තොට | මාරී (භාර්යාව), මුනිඅම්මා නොහොත් නවමනිඅම්මා (දුව), පෙරුමායි (දුව), කමලම් (දුව), නවමනි (දුව) |

# ආදයම් හා වියදම් පිළිබඳ වාතී

## ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල—1957 ඔක්තෝබර් 1 වැනි දින සිට 1958 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලසීමාව පිළිබඳ කළමනාකාර මණ්ඩලයේ වාර්තාවයි

**1. කළමනාකාර මණ්ඩලය :**

කළමනාකාර මණ්ඩලය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (සභාපති) සොලිසිටර් ජනරාල්, අධ්‍යාපන අධ්‍යක්ෂක සහ සමාජසේවා අධ්‍යක්ෂ යන නිල ලත් සාමාජිකයන් සිව් දෙනකුගෙන් සමන්විතය. අරමුදලේ දායකයකු වන පස්වැනි සාමාජිකයා සභාපති විසින් තෝරා පත් කරනු ලැබේ. දනට සිටින තෝරා පත් කරන ලද සාමාජිකයා ආර්. එස්. ජයවික්‍රම මහතා ය. අවුරුද්ද තුළදී මණ්ඩලය එක් වරක් රැස් විය.

**2. දායකයෝ :**

දායක සංඛ්‍යාව 20,000 ක් වෙතැයි ගණන් බලා තිබේ. 1954 ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳ රෙකුලාසිවල 10 (1) වැනි රෙගුලාසිය යටතේ සැපයිය යුතු පවුල පිළිබඳ විස්තර ප්‍රකාශන අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් දැන් ලැබෙන්නේ ය. 1958 සැප්තැම්බර් 30 වැනි දින තෙක් ප්‍රකාශන 10,214 ක් පමණ ලැබී තිබේ.

**3. නිභ අය කර ගැනීමේ ලේඛන :**

1957-58 වර්ෂය පිළිබඳ අයකර ගැනීමේ ලේඛන ළඟදීම ලැබෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

**4. අරමුදල තක්සේරු කිරීම :**

7 වැනි රෙගුලාසියේ ප්‍රකාර පළමුවැනි පංච වාර්ෂික තක්සේරු කිරීම 1956 සැප්තැම්බර් 30 වැනි දින තෙක් කාලය සඳහාය. මේ පිළිබඳ ජීවන සංඛ්‍යා නිලධාරීන්ට තොරතුරු සැපයීම සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර දැනට මුද්‍රණය කර ඇත. එම වැඩ කටයුතු 1958-59 වර්ෂය තුළදී කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. පවුල් පිළිබඳ කෙරෙන විස්තර ප්‍රකාශන විශාල සංඛ්‍යාවක් තවම ලැබීමට ඇති හෙයින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව ඒවා ලබා ගැනීමට උත්සාහ දරනු ලැබේ.

**5. හිමිකම් පෑම :**

1958 සැප්තැම්බර් 30 වැනි දින තෙක් විශ්‍රාම වැටුප් දීමනා 266 ක් අනුමත කර ඇත. මේ අවුරුද්ද ඇතුළත අනුමත කරන ලද ඒවා 50 කි.
අනුමත කරන ලද ආපසු ගෙවීම් 116 න් අවුරුද්ද ඇතුළත රෙගුලාසි 27 සහ 28 යටතේ අනුමත කරන ලද ආපසු ගෙවීම් 34 කි.

**6. ආයතන වියදම් ආදිය :**

පසුගිය අවුරුද්දේ ගෙවන ලද ප්‍රමාණය වන රු. 6,17,481.48 වන අතර මේ අවුරුද්ද වෙනුවෙන් අරමුදලට රජයෙන් ගෙවන ලද දායක මුදල රු. 6,76,513.84 කි. අරමුදල පාලනය පිළිබඳ අනියම් වියදම් වන ආයතන වියදම් ආදිය සහ අරමුදල යටතේ දෙනු ලබන විශ්‍රාම වැටුප් පිළිබඳ ජීවනාධාර දීමනාද රජය මඟින් ගෙවනු ලැබේ.

**7. මුදල් යෙදවීම :**

1953 අංක 44 දරණ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ 5 (1) වගන්තියේ ප්‍රකාර අරමුදලේ වැඩිමනත් මුදල්, භාරකාර ආඥාපනතේ (72 වැනි පරිච්ඡෙදයේ) 20 වැනි වගන්තියේ නියමිත ඇප සඳහා යොදවනු ලැබේ. මේ වර්ෂය තුළ ලාභ සඳහා තැන්පත් කරන ලද මුදල රු. 11,06,311.02 කි. 1958 සැප්තැම්බර් 30 වැනි දින වන විට අරමුදල නමට තිබූ ශේෂය වන රු. 7,06,505.72 ඉන් පසුව ලාභ සඳහා යොදවන ලද්දේ වෙයි.

**8. ගණන් හිලව් :**

ඔඩිටර් ජනරාල් විසින් විධි වූ පරීක්ෂා කරන ලද 1958 සැප්තැම්බර් 30 වැනි දිනෙන් අවසන් වූ අවුරුද්දේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශනයක් ද එදිනට අරමුදලේ වත්කම පිළිබඳ ප්‍රකාශනයක්ද මෙයට අමුනා ඇත.

බී. වී. ජෝර්ජ්,
ලේකම් හා ගණකාධිකාරී.

එච්. ඊ. පීරිස්,
සභාපති.

එම්. තිරුචෙල්වම්.
එස්. එෆ්. ද සිල්වා.
ටී. ඩී. උඩුවෙල.
ආර්. එස්. ජයවික්‍රම.

## ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

**1957 ඔක්තෝබර් 1 වැනි දින සිට 1958 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලය පිළිබඳ අයවැය වාර්තාවයි.**

**අය**

| | රු. | ශ. |
|---|---|---|
| ඉතිරි වී ඉදිරියට ගෙනෙන ලදුව ... ... | 3,15,134 | 11 |
| දායක මුදල් ... ... ... | 6,76,552 | 24 |
| රෙගුලාසි 21 යටතේ ගුරු සේවය අහිමි වූ අය විසින් ගෙවන ලද දායක මුදල් ... ... ... | 187 | 60 |
| ආණ්ඩුවෙන් ලැබුණු ආධාර මුදල් ... ... | 6,76,513 | 84 |
| යොදවා ඇති මුදලේ පොලිය ... ... | 1,95,006 | 05 |
| විවිධ අය ... ... ... | 5,532 | 67 |
| | 18,68,926 | 51 |

**වැය**

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| අවුරුද්ද ඇතුළත ලාභ සඳහා තැන්පත් කළ මුදල් ... | | | 11,06,311 | 02 |
| අවුරුද්ද තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් වෙනුවෙන් ... | | | 44,288 | 28 |
| ආපසු ගෙවීම් 27, 28 වැනි රෙගුලාසි යටතේ | 6,006 | 18 | | |
| වැඩිපුර අය වූ මුදල් ... | 142 | 87 | | |
| | | | 6,149 | 05 |
| විවිධ වැය ... ... | | | 5,672 | 44 |
| ඉතිරි ... ... ... | | | 7,06,505 | 72 |
| | | | 18,68,926 | 51 |

**සංලක්ෂය.**—අරමුදල යටතේ විශ්‍රාම වැටුප් අනුව ගෙවන ලද ජීවනාධාර හා විශෙෂ ජීවනාධාර වෙනුවෙන් ශුද්ධ වියදම පිළිවෙලින් රු. 86,927.46 සහ රු. 49,766.13 ක් විය. මේ ගෙවීම් 1957/58 වර්ෂයේ ශීර්ෂ 21, වැය ශීර්ෂ 1, උප ශීර්ෂ 2 කින් ගෙවන ලදී.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සභාපති.

බී. වී. ජෝර්ජ්,
ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී.

1960, ජනවාරි 6 දිනදී,
කොළඹදීය.

1954 ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 6 (1) වැනි රෙගුලාසිය අනුව ඉහත සඳහන් ගණන් හිලව් වාර්තාව මා විසින් පරීක්ෂා කරන ලදී. කළමනාකාර මණ්ඩලයේ සභාපති වෙත යවන ලද 1960 ජනවාරි 12 වැනි දිනය හා අංක පී-5/ටී.-15 දරණ මගේ වාර්තාවේ සඳහන් අදහස්වලට යටත්ව මේ ප්‍රකාශනයෙන් 1958 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්ෂය පිළිබඳ අය වැය නිවැරදිව ඉදිරිපත් කර ඇති බව මගේ කල්පනාවයි.

ඩී. එස්. ද සිල්වා,
ඔඩිටර් ජනරාල් වෙනුවටය.

1960 ජනවාරි 12 වැනි දින,
ගණන් පරීක්ෂක කාර්යාලයේදීය.
කොළඹ 7.

## 1957–58 වර්ෂයේ මුදල් යෙදවීම

| | දිනය | නයකර පිළිබඳ විස්තර | ප්‍රකාශන අගය | වෙළඳ මිල | ගත් මිල | එකතුවූ පොලිය | ගෙවන මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1. | 25.10.1957 ... | 3½% එන්.එල්. 1964/69 ... | ... 13,500 0 | ... 102½ | ... 13,838 50 | ... 110 03 | ... 13,948 53 |
| 2. | 29.10.1957 ... | එම ... | ... 40,000 0 | ... 102⅝ | ... 41,051 0 | ... 341 37 | ... 41,392 37 |
| 3. | 1.11.1957 ... | 3½% එන්.එච්.බී. 1969/71 ... | ... 5,000 0 | ... 102¾ | ... 5,138 50 | ... 73 36 | ... 5,211 86 |
| 4. | 1.11.1957 ... | 3½% එන්.එච්.බී. 1970/73 ... | ... 1,50,000 0 | ... 100 | ... 1,50,000 0 | ... — | ... 1,50,000 0 |
| 5. | 5.11.1957 ... | 3½% එන්.එල්. 1964/69 ... | ... 19,000 0 | ... 102⅝ | ... 19,499 75 | ... 174 90 | ... 19,674 65 |
| 6. | 20.11.1957 ... | 3½% එන්.එල්. 1964/69 ... | ... 10,000 0 | ... 102⅝ | ... 10,263 50 | ... 106 44 | ... 10,369 94 |
| 7. | 2.12.1957 ... | 3¼% එල්. 1973/77 ... | ... 1,00,000 0 | ... 100 | ... 1,00,000 0 | ... — | ... 1,00,000 0 |
| 8. | 2.1.1958 ... | 3½% එන්.එච්.බී. 1969/71 ... | ... 1,00,000 0 | ... 102¾ | ... 1,02,751 0 | ... 306 85 | ... 1,03,057 85 |
| 9. | 5.2.1958 ... | 3¼% එල්. 1973/77 ... | ... 35,000 0 | ... 100 | ... 35,001 0 | ... 205 68 | ... 35,206 68 |
| 10. | 1.3.1958 ... | 3¼% එල්. 1974/78 ... | ... 2,00,000 0 | ... 100 | ... 2,00,000 0 | ... — | ... 2,00,000 0 |
| 11. | 12.3.1958 ... | 3½% එල්. 1959/61 ... | ... 15,300 0 | ... 100¾ | ... 15,415 75 | ... 57 21 | ... 15,472 96 |
| 12. | 27.3.1958 ... | 3¼% එල්. 1973/77 ... | ... 75,000 0 | ... 100 | ... 75,001 0 | ... 774 66 | ... 75,775 66 |
| 13. | 30.4.1958 ... | 3¼% එන්.එච්.බී. 1974/78 ... | ... 2,00,000 0 | ... 100 | ... 2,00,000 0 | ... — | ... 2,00,000 0 |
| 14. | 1.6.1958 ... | 3¼% එල්. 1973/77 ... | ... 6,000 0 | ... 100 | ... 6,001 0 | ... — | ... 6,001 0 |
| 15. | 3.7.1958 ... | 3½% එල්. 1979/83 ... | ... 1,00,000 0 | ... 100 | ... 1,00,000 0 | ... — | ... 1,00,000 0 |
| 16. | 26.8.1958 ... | 3 % එල්. 1972/77 ... | ... 6,300 0 | ... 94 | ... 5,923 0 | ... 44 53 | ... 5,967 53 |
| 17. | 23.9.1958 ... | 3 % එල්. 1973/78 ... | ... 25,000 0 | ... 96¼ | ... 24,063 50 | ... 168 49 | ... 24,231 99 |
| | | | | | 11,03,947 50 | 2,363 52 | 11,06,311 02 |

ඩී. වී. ජෝර්ජ්,
ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ ලේකම් හා ගණකාධිකාරී.

1959 මාර්තු 25 දින, කොළඹදීය.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සභාපති.

1959 මාර්තු 5 දින, කොළඹදීය.

## ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල—1958 සැප්තැම්බර් 30 වන දින තෙක් වත්කම් පිළිබඳ ප්‍රකාශය

| | ලංකාණ්ඩුවෙන් ගත් ණයකර පිළිබඳ විස්තර | ප්‍රකාශක අගය | ගැනුම් මිල | 1957–58 ගත් දින තෙක් ගෙවන ලද පොලිය | මුළු වියදම | 1958 සැප්තැම්බර් 30 වැනි දිනට වෙළඳ මිල සහ මිළ කළ හැකි වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1973/78 3% ණය ... | ... 38,000 0... | 35,961 50... | 168 49... | 36,129 99... | 96 5/8 ... | 36,717 50 |
| 2. | 1967/72 2% ජාතික සංවර්ධන ණය | ... 6,000 0... | 5,176 0... | — ... | 5,176 0... | 94 1/4 ... | 5,655 0 |
| 3. | 1959/6933 % යුද්ධ ණය ... | ... 4,86,600 0... | 4,64,856 50... | — ... | 4,64,856 50... | 101 ... | 4,91,466 0 |
| 4. | 1969/71 3½% ජාතික නිවාස ණයකර | ... 5,05,000 0... | 5,12,015 50... | 380 21... | 5,12,395 71... | 106 3/16 ... | 5,36,246 87 1/2 |
| 5. | 1964/69 3½% ජාතික ණය | ... 10,62,400 0... | 10,92,692 75... | 732 74... | 10,93,425 49... | 105 3/8 ... | 11,19,504 0 |
| 6. | 1972/77 3% ණය ... | ... 31,300 0... | 29,781 25... | 44 53... | 29,825 78... | 97 1/8 ... | 30,400 12 1/2 |
| 7. | 1959/61 3½% ණය ... | ... 25,300 0... | 25,541 75... | 57 21... | 25,598 96... | 101 1/2 ... | 25,679 50 |
| 8. | 1969/74 3% ශ්‍රී ලංකා ණය | ... 10,00,000 0... | 10,00,626 0... | — ... | 10,00,626 0... | 100 ... | 10,00,000 0 |
| 9. | 1970/72 3¼% ජාතික නිවාස ණයකර | ... 5,00,000 0... | 5,00,000 0... | — ... | 5,00,000 0... | 102 13/16 ... | 5,14,062 50 |
| 10. | 1975/80 3¼% ණය ... | ... 2,35,000 0... | 2,35,000 0... | — ... | 2,35,000 0... | 98 5/16 ... | 2,31,034 37 1/2 |
| 11. | 1965/68 3% උගස් බැංකු ණයකර | ... 7,50,000 0... | 7,50,000 0... | — ... | 7,50,000 0... | 102 1/8 ... | 7,65,937 50 |
| 12. | 1969/71 3% ජාතික නිවාස ණයකර | ... 85,000 0... | 85,000 0... | — ... | 85,000 0... | 100 5/8 ... | 85,531 25 |
| 13. | 1976/81 3¼% ණය ... | ... 1,00,000 0... | 1,00,000 0... | — ... | 1,00,000 0... | 98 1/8 ... | 98,125 0 |
| 14. | 1969/72 3% ණය ... | ... 5,00,000 0... | 5,00,000 0... | — ... | 5,00,000 0... | 100 ... | 5,00,000 0 |
| 15. | 1976/81 3¼% ජාතික නිවාස ණයකර | ... 50,000 0... | 50,000 0... | — ... | 50,000 0... | 97 5/8 ... | 48,812 50 |
| 16. | 1970/73 3% ණය ... | ... 2,25,000 0... | 2,25,000 0... | — ... | 2,25,000 0... | 100 ... | 2,25,000 0 |
| 17. | 1970/73 3% උගස් බැංකු ණයකර | ... 1,65,000 0... | 1,65,000 0... | — ... | 1,65,000 0... | 100 ... | 1,65,000 0 |
| 18. | 1970/73 3% ජාතික නිවාස ණයකර | ... 1,00,000 0... | 1,00,000 0... | — ... | 1,00,000 0... | 100 ... | 1,00,000 0 |
| 19. | 1970/73 3% ලංකා සංවර්ධන ණය | ... 1,00,000 0... | 1,00,000 0... | — ... | 1,00,000 0... | 100 ... | 1,00,000 0 |
| 20. | 1970/73 3% ජාතික නිවාස ණයකර (බී. වර්ගය) ... | ... 1,50,000 0... | 1,50,000 0... | — ... | 1,50,000 0... | 100 ... | 1,50,000 0 |
| 21. | 1973/77 3¼% ණය ... | ... 2,16,000 0... | 2,16,003 0... | 980 34... | 2,16,983 34... | 100 11/16 ... | 2,17,485 0 |
| 22. | 1974/78 3¼% ණය ... | ... 2,00,000 0... | 2,00,000 0... | — ... | 2,00,000 0... | 100 9/16 ... | 2,01,125 0 |
| 23. | 1974/78 3¼% ජාතික නිවාස ණයකර | ... 2,00,000 0... | 2,00,000 0... | — ... | 2,00,000 0... | 100 7/16 ... | 2,00,875 0 |
| 24. | 1979/83 3½% ණය ... | ... 1,00,000 0... | 1,00,000 0... | — ... | 1,00,000 0... | 100 3/16 ... | 1,00,187 50 |
| | | 68,30,600 0 | 68,42,654 25 | 2,363 52 | 68,45,017 77 | | 69,48,844 62 1/2 |

ඩී. වී. ජෝර්ජ්,
ලේකම් හා ගණකාධිකාරී, කළමනාකාර මණ්ඩලය, ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමවැටුප් අරමුදල.

1959 මාර්තු 25 වැනි දින, කොළඹදීය.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා ගුරුවරුන්ගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමවැටුප් අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ සභාපති.

1959 මාර්තු මස 25 වැනි දින

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

**දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අලුත්වැඩියා කිරීම**

කැළණිවැලි දුම්රිය මාර්ගයේ මහරගම සහ පන්නිපිටිය දුම්රිය පලවල් අතර හැ. 10, ද. 53 දරණ පන්නිපිටිය-බොරැල්ල පාර දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය බතුර පසිප්පයක් දැමීම සඳහා වර්ෂ 1960 අප්‍රේල් මස 16 වෙනි සෙනසුරාදා රාත්‍රි 9යේ සිට පසුදින ඉරිදා උදය 7 දක්වා වසා තබනු ලැබේ.

මෙම කාලය තුළදී කොළඹ පැත්තෙන් යන රථවාහනාදිය මහරගම පරණ පාර, පමුනුව පාර සහ පොල්වත්ත පාරෙන්ද, හෝමාගම දෙසින් යන රථවාහන පරණ පාර, මොරකැටිය හංදිය, හෝකන්දර පාර, සහ කලල්ගොඩ පාරෙන්ද ගමන් කළ යුතුයි.

## " හෙමරේජික් සෙප්ටිසීමියා " නමැති රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තු ආදායම් නිලධාරි කොට්ඨාශයේ දේවමැදි කෝරළේ ඉපලව ගම් මුලාදෑනි වසමේ පොල්ගාමන වතුයායෙහි ගවයන් අතර " හෙමරේජික් සෙප්ටිසීමියා " නමැති රෝගය පැතිරී යන බැව් 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1960ක් වූ පෙබරවාරි මස 22 වෙනි දින අංක 12,041 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1960ක් වූ අප්‍රේල් මස 5 වැනි දින,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි කාර්යාලයය,
පේරාදෙණිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.